සන්නස

සංස්කරණය/Editor
අසෝක සුබසිංහ Asoka Subasinghe

උපදේශක සංස්කාරක
ජගත් ජේ ඒදිරිසිංහ Jagath J Edirisinghe

සංස්කරණ සහය/Asst. Editors
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

ක්‍රීඩා සංස්කාරක
අසෝක සිල්වා Asoka Silva

සන්නස පිරිවර

සිසිර දිසානායක
වි ක ධර්මමන්ධු
ආචාර්ය විද්‍යානි මනතුංග
ශ්‍රියානි මද්දුමගේ
චන්දි මාපා
මගින්ද දිසානායක දිවුල්ගනේ
ශ්‍රියා කුමාරසිංහ
මේනකා ජයතිලක

සේයා රූ
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න

පිටු සැකසුම සහ ග්‍රැෆික් නිර්මාණ
Page Layout & Graphic Designs
සාමන්ත තැන්නගේ Saamantha Tennege

සම්බන්ධීකරණය

NSW
Lakshman Kodituwakku
02 9626 7660
02 9837 5055

WA
Kapila Hemantha Balage
08 9456 1972

QLD
Ananda Samaratunga
07 3372 7953

ACT
Asoka Nimalasiri
0400 429 031

SA
Chandra Eeriyagama
08 8331 2318

TAS
Anura Seneviratne
03 6327 4259

Sannasa
61 Nettle Drive
Hallam Vic 3803 Australia
Web: www.sannasa.net
email : sannasanews@gmail.com
Tel/Fax : 03 9402 5380

පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගන්න බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත.

CIRCULATION - 10000 COPIES IN AUSTRALIA

සංස්කාරක සටහන

නව සහශ්‍රයට සන්නස පුවත්පත විවෘත වේදිකාවකි. මෙහි පළවන ලිපි වල අන්තර්ගත වන්නේ එම ලිපි ලියන ලේඛකයන්ගේ අදහස් ය. ඒ ලිපි තුළින් කතා බහ කෙරෙන කාරණා පිළිබඳව ඔබට ද මතයක් ඇත්නම් ඔබේ අදහසට ද ඉඩක් ලබා දෙන්නට අපි සැමවිටම උත්සාහ කරන්නෙමු. ඔබේ ලිපිය ඉතා කෙටියෙන් ලියන්න. පුවත් පතේ ඉඩ, අදහස නිරවුල් ව ඉදිරිපත් නොකිරීම, වැරදි භාෂාව, වැනි හේතු මත සියලුම ලිපි සංස්කරණයට භාජනය විය හැකි බව සළකන්න.

මේ කොයි යන්නේ

අඩ සිය වසකට ආසන්න කාලයක් තිස්සේ ලාංකීය සිංහල දෙමල මුස්ලිම් ජනයා වෙන රට පාලනය කළ ආණ්ඩු විසින් හා එළිවරීම් පුමුඛ සන්නද්ධ සංවිධාන විසින් උරුම කර දෙනු ලැබ ඇති අනියය විනාශකාරී යුද්ධය උත්සන්න අවස්ථාවකට පැමිණ ඇති බව පෙනෙනෙන්ට තිබේ. සියලු පොදු කාරනා ඉවතට දමමින් රට වැසි ජනතාවගේ ප්‍රධාන අවධානය යොමු වී ඇත්තේ උතුරේ සිදුවන යුද්ධය ක්‍රියාත්මකයන්හි වාර්තා වෙත බැව් පෙනී යයි. සියල්ලන්ම තුන්තොලයෙන් රට මුදා ගන්නා අවස්ථ සටන මෙය යයි විශ්වාසයට ගනිමින් සිටිති. එම අවස්ථාව ඉතා සූක්ෂ්ම ලෙස තමන්ගේ පැවැත්ම තහවුරු කර ගැනීම උදෙසා යොදාගැනීමට ආණ්ඩුව සමත් වෙමින් තිබෙනු පෙනෙනෙන්ට තිබේ. දේශප්‍රේමී යුද්ධයේ නාමය පෙරට දමමින් ජනතාධිය පාලනය කිරීම මත්තා නිති පැනවීම අයිතීන් කප්පාදුව අත්‍යවශ්‍ය තාණ්ඩ මිල ඉහළ දැමීම ආදිය තමනට ඊයි ලෙස කිරීමට දැන් ඉඩ කඩ සැකසාගෙන තිබේ. දැන හෝ නොදැන අවේ ජනතාවට දැන් සිදුවී ඇත්තේ හයානක සුරාකෑමක ගොදුරු බවට පත්වීමටය. ගෑස් ඉන්ධන විදුලිය මිල එක පෙළට ඉහළ යාම නිසා ජනතාවට සිදුව ඇත්තේ අත්‍යවශ්‍ය උවමනාවන් අතුරිනුත් තෝරා බේරාගෙන මුදල් වැය කරන ප්‍රතිපත්තියකට යොමු වීමටය. මේ අනුව කුමක් හෝ බඩට දමා ගැනීම බහුතරයකගේ පිවිතය වී තිබේ.

ජනතාව ඇති දෙයක් කා යුද්ධය වෙනුවෙන් සියල්ල ඉවසා දරාගෙන සිටින ආණ්ඩුව තේරුම් ගෙන ඇත්තේ කෙලෙයක ද? එය හිඩැස්සු නොවන ආකාරයට බව රට තුළ සිදුවන දෙයින් අපට පෙනෙයි. යුද්ධයක් ඇති බව සත්‍යයකි. එසේම මේ යුද්ධය රජය කරන්නේ මහජනතාවගේ බදු මුදල් වලින් මිය ඇති ඇමති වරප්තගේ පෞද්ගලික ඛුදලයික් නොවේ. ඒ නිසා යුද්ධය පිළිබඳ සත්‍ය තොරතුරු දැන ගැනීමටත් රජයේ හා ප්‍රතිවිරුද්ධ අදහස් දැනගැනීමටත් ජනතාවට ඇති අයිතිය පිළිගත යුතු ය. කුමන තත්වයක් යටතේ වුව ද අදහස් ප්‍රකාශ කිරීමට හා විවේචනයට ඉඩක් තිබිය යුතු ය. අත්‍යවශ්‍යවකට මෙන් සිදු නොවන්නේ ද එයයි.

මේ යුද්ධය පිළිබඳ කුමන ආකාරයක හෝ විරුද්ධ අදහස් දැරීම සපුරා තහනම් ව තිබේ. යම්කිසිවකුට මේ පිළිබඳව යම් විමසීමක් අද්දැල එයම බහුගේ අවධානයට ගෝතුවක් වීම සංවේගයට කරුණකි. ජාතික ආරක්ෂාවට බලවත් තර්ජනයක් එල්ල වී ඇති අවධියක ජනතාවගේ තොරතුරු දැනගැනීමේ අයිතියට සීමාවක් තිබිය යුතු නමුදු එය බලහත්කාරයක් බවට පත් නොවිය යුතු ය. රටේ දැන් සිදුවෙමින් තිබෙන්නේ රජය යුද්ධය පිළිබඳ පවසන දේ පමණක් ජනතාව පිළිගත යුතු ය යන තැනට ජනතාව බලෙන් තල්ලු කිරීම ය.

ජනතාවගේ නිදාසය අහිමි කරමින් විරුද්ධවාදීන් මර්දනය කරමින් රජය යම් ඒකාධිපති පාලනයක් කරා රට ගෙන යාමට තැත් කරන්නේ නම් ප්‍රතිවිලාස වමාත් දැරුණු විය හැකි ය. මන්ද ලෝකයේ බොහෝ ඒකාධිපතීන් සිය පාලනයට රටවල් නතු කර ගැනීමට පුළුව තම ගමන් ආරම්භ කර ඇත්තේ දේශප්‍රේමී සටන් හඳවා බැවිනි. ඒ ගමන් වල අවසන් ප්‍රතිවිල අපි අපා කියවා ඇත්විද ඇත්හොමු. අපේ රට එවැනි අවස්ථාවක් කරා යොමු වන්නට ඉඩ නොතැබීම අප සැමගෙ වගකීමයි.

මෙවර අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගෙන් භාගයක්ම අසමත් වී ඇති බව හෙළිදරව් වී තිබේ. පසු ගිය අවුරුදු වල සිට විකෙන් ටික වර්ධනය වී උත්සන්න වූ ව්‍යසනයකි මේ. මුලින් මුලින් ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව ගණකාධිකරණය වැනි තාර්කික බුද්ධිය වඩ වඩාත් පුවමනා කරෙන විෂයයන් හි දරුවන් සිය අසමත්භාවය පෙන් වූ අතර අධ්‍යාපන ප්‍රධානීන් ඊට විසැඳුම් සොයාගත්තේ ඒ ඒ විෂයයන් ට අයත් පාඨමාලා කප්පාදු කිරීමෙන් ය. හරියට සමහර ජෝං බාස්ලා තමන් නොදන්නා එන්පින් අලුත්වැඩියා කරන්නනට ගොස් පැරදි, නැවත නියමිත පරිදි සවි කරන්නට නොදැන ඉතිරිවන අෂණ මුරච්චි වැඩකට නැති ඒවායැයි කියා අහකට විසි කරනවා මෙන්ය. නැතහොත් මුරටිය බේරා ගන්නට එළුවාගේ බෙල්ලකපුවා මෙන්ය. අධ්‍යාපන මහදැන මුත්තන් ද ඔවුන්ගෙ ගෝලයන් ද දුන් ඒ විසැඳුම් වලින් පසුවද ගණිතය සමත් වන්නේ සියයට හතරක් තරමිය. කප්පාදු කළ අනෙක් විෂයයන් ගේ තත්ත්වයද එබඳුය. දැන් කොයි විෂයයත් සමත් වීමට දරුවන් අසමත්ය. සියයට හතරක්වත් සමත් වන්නේ නැති විෂයයන් විෂය මාලාවෙන් ඉවත් කළයුතු බවක් ද මරෙක විභාග කොමසාරිස්වරයා පැවසුව බවත් මතකය. අධ්‍යාපනයේ බිඳවැටීමට දුන් විසැඳුම් එබඳුය. ඒ අනුව ගණිතය ඉංග්‍රීසි භාෂාව වැනි විෂයයන් ඇත්තේ රතු ලැයිස්තුවේ බව පැහැදිලිය. එක එක දේශප්‍රේමී පණ්ඩිත කතා දොඩවමින් ද, බටහිර ලෝකයට දොස්නග මින් ද සිටියා මිස කොතැනක හෝ තමන් අනුයන කුමයේ මුල කුණු වී ඇති බවනම් කියවටන් අපේ අධ්‍යාපන පණ්ඩිතයෝ වටහා නොගත්හ. තවමත් ඒ ගැන වගේ වගක් නැත. අධ්‍යාපන ඇමැතිවරයාට ද ඒ ගැන හාංකවිසියක්වත් නැති ගානය. බාග වෙලාවට ආණ්ඩුවේ අනෙක් ලොක්කන් මෙන්ම පළමුව මවුබිම දෙවනුව පාසල කියා අධ්‍යාපන අමති වරයාත් කල්පනා කරනවා වන්නට බැරි නැත. එහෙමත් නැත්නම් මේ රණශූරයන්ගේ යුගය බැවින් සාමාන්‍ය පංතියේ දරුවන්ගේ විභාග වලින් අසමත් වීම කාලයට ගැලපෙන වාසනාවක් යැයි කියා සිතුවා වන්නටත් බැරි නැත. කොයි හැටි වෙතත්, මේ අධ්‍යාපන පරිහානියෙන් අනෙක් ජන සමූහ වැනසීම කොතෙක් දුරට සාර්ථක වී අත්දැයි නොදැනිතත්, දේශප්‍රේමීන් විසින් ඉවත් දී රැක ගන්නවායැයි කියන සිංහළ ජාතියේ අෂණ මුරච්චි ටික නම් මේ වනවිට හැළි ඇති බව පැහැදිලිය. කොයිහැටි වෙතත් 2500 ඉතිහාසයක බර කරේ තබාගෙන සිටින වීර සිංහළ ජාතිය මිගි තලයේ අසරණයන් බවට පත් වෙමින් සිටී.

මේ විදියට අසමත් වූ ශිෂ්‍යයන් කවුද?

ප්‍රගීත් එක්නැලිගොඩ

ලංකාවේ වසල නායකයන් කළේ ආණ්ඩුවේ පාසල් ගණන වැඩිකරනවා වෙනුවට තමන් මහ ලොකු වැඩක් කළා කියා මෝඩ මහජනයාට පෙන්වීමට අර ස්වාධීනව ගොඩනැගුනු පෞද්ගලික පාසල් පද්ධතිය ආණ්ඩුවට උදුරා ගැනීමය. අතින් වියදමක් නැතිව සූර සරදියල් මෙන් කාගේ හෝ දෙයක් උදුරාගෙන ගැලරියට මැපික් පෙන්වීම ලංකාවේ දේශපාලන වසලයන්ගේ නොමැකෙන පුරුදදකි. අනතුරුව සිංහළ පමණක් යැයි කියා ඉංග්‍රීසි මාධ්‍ය පාසල් වලට හිත තබා, සිංහළ ජාතිය අතර වීරයන් වන්නට ක්‍රියා කළේත් ඒ පුරුදදට අනුව යමිනි. එහැන් සිට ඉංග්‍රීසි දැනුම ප්‍රභූ ආභරණයක් බවට පත් විය. 56 විප්ලවයේ ප්‍රතිපලයක් ලෙස උපන් ඉංග්‍රීසි නොදත් අසරණ සිංහළ තරුණයා බේරා ගන්නට අද 56 විප්ලවයේ වීරයන් නැත.

ඔවුන් අසමත් වූයේ ඇයි? ඔවුන්ගේ අනාගතය මෙන්ම රටේ අනාගතයට එ මගින් සිදුවිය හැකි අනර්ථය කුමක්ද? ලෝකය ඉදිරියේ අප අසරණ වෙයිද? ආදි ප්‍රශ්න ශිෂ්ට සම්පන්න රටක වග කිවයුතු බුද්ධිමත් අධ්‍යාපන ඇමැතිවරයෙකුටනම් බැරෑරුම් ප්‍රශ්න වනවාට සැකයක් නැත. ශිෂ්ට සම්පන්න රටක වගකිවයුතු කැබිනට් මණ්ඩලයකට හෝ රටේ නායකයාට ද එය බරපතල ප්‍රශ්නයක් වනවාට සැකයක් නැත. එ හෙත් පුදුමය නම් ලෝකෙන්ම උතුම් ලංකාවේ දේශප්‍රේමී ආණ්ඩුවට ඒ ගැන කිසි ගානක් නැති වීමය. ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වන්නට වර දරනා රටක, අධ්‍යාපනය ද හේතුවක් කරගත් ගැඹුරු සමාජ ගැටුමක් ද ඇවිලී ඇති රටක, අධ්‍යාපනය යනු වැදගත්ම විෂය ක්ෂේත්‍රයකි. ඒ නැතත් මේ යුගය වූ කලි, ලෝකයේ සිදුවන හා ප්‍රලාවාව ප්‍රමුඛ තොරගත් සංවර්ධනය සිදුවන, අලුත් ශිෂ්ටාචාරයේ යුගයයි. දැනුම ප්‍රාග් ධනය ලෙස සලකන යුගයයි. එවන් යුගයක මෙවන් රටක අධ්‍යාපනයේ බිඳ වැටීමක් සිදුවන්නට ඉඩහැර, ඒ රටේ බාල පරපුර වලපෙල්ලට ගියාවේ කියා බලා සිටිය හැක්කේ පාපිෂ්ට පාලකයෙකුටම පමනි. දේශප්‍රේමයම උදේ හවා ජප කරන උදවිය ඒ ගැන ගැඹුරින් සිතිය යුතුය. මන්ද කියනවානම් ජන සමාජයකටම ඉතිහාසයේ හිමි වටිනා අවස්ථා අහිමි කිරීම ඒ ජන සමාජයට කරන ද්‍රෝහී කමක් බැවිනි. එහෙත් ඒ අය නිහඬය. උදේ ඉඳන් රෑ වන තෙක් ම ඔවුන් මහජනයා මුලා කිරීමට ජප කරනා දේශප්‍රේමී මංත්‍රයේ යටා තත්ත්වය එසේය. යුද්ධය ඉවර වන දිනක් තිබුනෝතින් එදාට ආණ්ඩුවත් කැබිනට් මණ්ඩලයත් ඔවුන්ගේ පවුල් ටිකත් රැ කී සිටියොත් මදි ද?

සියවසකටත් වැඩි කාලයක් තිස්සේ අධ්‍යාපනය ශ්‍රී ලංකාවේ දේපාලනඥයන්ගේ වැදගත් පොර පිටියකි. 1956 දී බණ්ඩාරනායක

26 වන පිටුවට